**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය - 2017**

**------------------------------------------------------------------------**

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථා ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මේ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සමාගමේ සභාපති වෙත 2018 ජූනි 08 වන දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී . ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය අනුව අස්තිත්වයක් විසින් ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී දේපල, පිරියත හා උපකරණ අපහරණයෙන් ලද ලාභය රු.3,608,251 ක් හා එම අලාභය රු.129,042 ක් හිලව් කර ශුද්ධ

ලාභය රු.3,479,209 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, වසන්තම් ටීවී නාලිකාවේ රු.86,900,996 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන් රු.10,785,379 ක් වූ බැර ශේෂය හිලව් කර ශුද්ධ ශේෂය රු.76,115,617 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 හි 09 ඡේදය අනුව තොග, ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන වටිනාකම් දෙකෙන් අඩු වටිනාකමට අගයකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද සමාගම විසින්, තොගය තුළ ඇතුළත් අමතර කොටස් සහ වෙනත් තොග ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කිරීමකින් තොරව රු.16,671,347 ක් වූ පිරිවැයට ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 79, 80 සහ 81 වගන්ති ප්‍රකාරව, සමාගම විසින් බදු සම්බන්ධයෙන් ඇති විස්තර පිළිබඳව අවම අවශ්‍යතාවයන් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් හෙළිදරව් කළ යුතුය. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 12 හි දැක්වෙන ආදායම් බදු සටහන තුළ එම තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,212,616,242 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා ලැබී තිබුණු රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා සමාගම විසින් හඳුනාගෙන තිබුණු ප්‍රතිපත්තිය අනුව අයිටීඑන් නාලිකාව සඳහා 2008 වර්ෂයේදී ලද රු.31,221,094 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට ක්‍රමක්ෂය ලෙස ආදායමට ගෙන අවසන් විය යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් රු.9,889,242 ක ශේෂයක් ඉතිරි වී තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 16 හි 55 ඡේදය ප්‍රකාරව වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්වයට ගෙන ආ පසු එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස 2017 දෙසැම්බර් 31 දින කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරු කර තිබූ රු.325,240,826 ක් වටිනා මැදිරි සංකීර්ණයට අදාළව රු.1,355,170 ක් ක්ෂය ලෙස සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි.

(උ) 2016 වර්ෂයට අදාල මෝටර් වාහන ක්ෂය රු.4,847,768 ක් සමාලෝචිත වර්ෂයට අදාළව ගැලපීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොග සත්‍යාපන වාර්තාව අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු.16,707,119 ක් වූ තොගය තුළ 2017 වර්ෂයට පෙර වර්ෂවලට අදාළ කළමනාකරණ දිනපොත්, වාර්ෂික වාර්තා, සුභ පැතුම්පත් වැනි නැවත භාවිතයට ගත නොහැකි රු.967,087 ක තොග ඇතුළත්ව තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ ණයගැතියෝ, අගරු චෙක්පත් ණයගැතියෝ සහ වෙනත් ණයගැතියෝ සඳහා හානිකරණ ගැලපුම් වටිනාකම රු.214,434,350 ක් වූ අතර ඒ සඳහා විලම්බිත බදු වත්කම රු.60,041,618 ක් විය යුතුය. නමුත් සමාගම විසින් විලම්බිත බදු ගණනය කිරීමේදී එම වටිනාකම රු.44,141,189 ක් ලෙස ගණනය කර තිබුණි. එසේම සේවක ණය සඳහා හානිකරණ වටිනාකම රු.128,125 ක් වූ අතර ඒ සඳහා විලම්බිත බදු වත්කම රු.35,882 ක් විය යුතු වුවත් සමාගම විසින් විලම්බිත බදු වත්කම රු.375,556 ක්

ලෙස සලකා බදු ගණනය කර තිබුණි. ඒ අනුව සමාගමේ විලම්බිත බදු වගකීම රු.179,966,317 ක් වන අතර නිවැරදි විලම්බිත බදු වත්කම රු.88,277,381 ක් විය යුතු වන බැවින් ශුද්ධ විලම්බිත බදු වගකීම රු.91,688,936 ක් විය යුතු වුවත් එම වටිනාකම රු.107,249,693 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් විලම්බිත බදු වගකීම රු.15,560,757 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාගම විසින් 2017 වර්ෂයේ අවසාන කාර්තුව සඳහා ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු වූ රු.1,971,596 ක් උපචිත ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස ගිණුම් ගතකර තිබූ විදුලි වියදම් රු.301,048 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ අතර එම මුදල විදුලි වියදම් ගිණුමට බැරකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාගමේ ඉදිකරන ලද නව කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ලේ විදුලි සෝපානය සවිකිරීමේ ගාස්තු වශයෙන් 2017 නොවැම්බර් 07 දින රු.940,000 ක් අදාළ සමාගමට ගෙවා තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට එය නැවතත් උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ක) 2015 වර්ෂයේ දී සමාගම උපයා ගත් ලාභය පදනම් කරගෙන ලාභාංශ වශයෙන් භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.11,651,061 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ග) 2016 දෙසැම්බර් 30 දින සිට සියයට 5.75 ක් වන වාර්ෂික පොලියක් යටතේ රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන රු.5,000,000 ක් වූ කාලීන තැන්පතුවේ පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ච) 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.16,294,701 ක් වූ අගරු චෙක්පත් වටිනාකම සඳහා හානිකරණ ගැලපීම් සිදු කර තිබූ නමුත් ඒ තුළ ඇතුළත් රු.1,866,665 ක් වටිනා චෙක්පත් දෙකකට අදාළ ණයගැතියා විසින් 2017 වර්ෂයේදී වාරික වශයෙන් මුදල් ගෙවීම ආරම්භ කර තිබුණි. එහෙත් එම වටිනාකම හානිකරණ ගැලපීමෙන් ඉවත් කර නොතිබුණි.

(ජ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොග සත්‍යාපන වාර්තා අනුව තොග ශේෂයේ වටිනාකම රු.16,707,119 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව තොග වටිනාකම රු.16,671,347 ක් වූයෙන් රු.35,772 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ට) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.25,446,073 ක් වූ අතර බදු වාර්තා අනුව එම වටිනාකම රු.20,694,067 ක් වූයෙන් එම වාර්තා දෙක අතර රු.4,752,006 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඩ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ජාතිය ගොඩනැගීමේ බදු වියදම රු.28,975,025 ක් වූ අතර බදු වාර්තා අනුව බදු වියදම රු.28,784,687 ක් වූයෙන් එම වාර්තා දෙක අතර රු.190,338 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ප) සමාලෝචිත වර්ෂය තුළදී ලෙජරය අනුව මුදලින් ලැබී තිබූ පොලී ආදායම රු.147,893,580 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රු.164,021,890 ක් ලෙස දක්වා තිබුණි.

(බ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන හා ස්ථාවර වත්කම් ලේඛනය අතර ලී බඩු හා සවි කිරීම්වලට අදාල රු.622,247 ක හා කාර්යාල උපකරණ, සම්ප්‍රේෂණ උපකරණ සහ යන්ත්‍ර හා පිරියතවලට අදාලව රු.51,655,399 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ත) වාර්ෂික තොග සමීක්ෂණයේදී සෙමින් චලනය වන තොග ශේෂය රු.6,430,112 ක් ලෙස හඳුනාගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ එම ශේෂය රු.7,130,390 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.700,278 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

--------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනී යන අන්දමට ප්‍රමාණවත් ලෙස සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

#### 2.3.1 ලැබිය යුතු මුදල්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003, 2005, 2006 සහ 2007 වර්ෂවලදී සමාගම විසින් සිදු කරන ලද ප්‍රතිවෙළඳ ගනුදෙනුවලට අදාළව රු.14,641,728 ක් වටිනා සේවා කාලීනව ලබා නොගැනීම හේතුවෙන් එම සම්පූර්ණ වටිනාකම සඳහා හානිකරණ ගැලපීම් සිදු කර තිබුණි.

(ආ) සමාගමේ සේවාදායක ණය ප්‍රතිපත්තිය අනුව ණය කාලය මාස 03 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, රු.854,178,740 ක් වූ සේවාදායක ණයගැතියන්ගෙන් මාස 03 සහ මාස 06 අතර ණයගැති ශේෂය රු.155,728,021 ක්ද, මාස 06ට වැඩි වර්ෂයට අඩු ණයගැති ශේෂය රු.149,939,388 ක්ද, වර්ෂයට වඩා වැඩි ණයගැති ශේෂය රු.178,239,352 ක්ද විය. මෙම මුළු ණයගැති ශේෂයෙන් රු.191,823,614 ක් සඳහා හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි.

(ඇ) සමාගම විසින් 2010 වර්ෂයේදී ජනමාධ්‍ය අමාත්‍යාංශයට ලබාදෙන ලද රූපවාහිනී යන්ත්‍ර 03 ක් සහ ඒවා සවිකිරීමේ ගාස්තු වෙනුවෙන් ලැබිය යුතු රු.329,973 ක් සමාලෝචිත වර්ෂය

අවසාන වන තුරුම ලැබී නොතිබුණි. එසේම, 2009 වර්ෂයේදී සමාගමේ නිලධාරීන් සිව් දෙනෙකු වෙනුවෙන් ගෙවන ලද රු.35,942 ක් වූ පෞද්ගලික දුරකථන බිල්පත් ගාස්තු සමාලෝචිත වර්ෂය වන විටද ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඇ) අත්තිකාරම් වශයෙන් පෞද්ගලික සැපයුම්කරුවන් වෙත රු.9,641,947 ක් ගෙවා තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන තුරුත් එම අදාළ කාර්යයන් සම්පූර්ණ කරවා ගෙන නොතිබුණු අතර අත්තිකාරම් මුදල්ද, පියවා ගෙන නොතිබුණි.

(ඉ) අයිටීඑන් එෆ්එම් නාලිකාවේ වෙළඳ ණයගැති ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේදී මත්තල ගුවන් තොටුපල සම්බන්ධයෙන් කරන ලද ප්‍රචාරණ කටයුත්තක් සඳහා Airport & Aviation Services Sri Lanka Ltd ආයතනයෙන් ලැබිය යුතු රු.106,479 ක් එම ආයතනය විසින් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ii) Bench Mark Strategic සහ සූරිය වාහිනී සෝලා පවර් නම් වූ සේවාදායක ණයගැති ආයතන දෙක මේ වන විට වසා දමා ඇති බැවින් එම ආයතන දෙකෙන් අයවිය යුතු පිළිවෙලින් රු.316,250 ක් සහ රු.241,500 ක් අයකර ගත නොහැකි වී තිබුණි.

(iii) සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් 2014 වර්ෂයේ සිට අයවිය යුතු රු.682,869 ක් ගෙවීම ලොතරැයි මණ්ඩලයේ නව පාලනාධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(iv) පස්යාල පෞද්ගලික කුෂන් වැඩපලක් සමග ඇති කරගත් ලිඛිත ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් එම ආයතනයෙන් අය විය යුතු රු.353,993 ක් අයකර ගත නොහැකි වී තිබුණි.

(v) රාජ්‍ය සංස්ථාවකින් 2010 වර්ෂයේ සිට අයවිය යුතු රු.288,400 ක් අයකර ගැනීම පිණිස එම සංස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා ලිඛිත ගිවිසුමක් හෝ වෙනත් විධිමත් ලියවිල්ලක් නොමැති වීම නිසා එම මුදල ගෙවිය නොහැකි බවත් විධිමත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේ නම් එම මුදල ගෙවිය හැකි බවත් එම සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා විසින් දන්වා තිබුණි.

(vi) සැණකෙලියක් පැවැත්වීම සම්බන්ධයෙන් වෙළඳ ප්‍රචාරක කටයුත්තක් සඳහා රජයේ විද්‍යාලයකින් ලැබිය යුතු රු.339,660 ක් ගෙවීම එම සැණකෙලියෙන් අලාභ සිදු වීම නිසා එම විද්‍යාලය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

**2.3.2 ගෙවිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.1,262,981 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු වටිනාකම තුළ 2015 දෙසැම්බර් 31 දක්වා කරන ලද තැන්පත් වටිනාකම රු.522,025 ක් විය. එම තැන්පත්කරුවන් හඳුනාගෙන එම මුදල් ආපසු ගෙවීමට හෝ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට ගණුදෙනුකරුවන් වෙත නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත් 774 ක වටිනාකම රු.5,833,109 ක් වූ අතර එම වටිනාකම අවලංගු කළ චෙක්පත් ගිණුමකට මාරුකර තිබුණි

(ඇ) මූලා‍ය ප්‍රකාශනයේ වෙනත් ගෙවිය යුතු ශේෂයන් යටතේ පවතින රු.1,351,789 ක් වූ හිමිකම් නොපෑ ගෙවීම් ශේෂය තුළ වර්ෂයකට වඩා පැරණි, හිමිකම් නොපෑ ශේෂය රු.974,651 ක් විය. නමුත් හිමිකම් පිළිබඳව තහවුරු කර ගැනීමෙන් පසුව මෙම මුදල් ආපසු ගෙවීමට හෝ එසේ නැතහොත් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.35,149,670 ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ රු.316,395 ක් වූ හඳුනා නොගත් ණයහිමි ශේෂයක් ඇතුළත්ව තිබුණි. මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරිමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - මුදල් රෙගුලාසි 396 | 2012 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා අවලංගු කරන ලද චෙක්පත් වටිනාකම රු.4,957,006 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 චක්‍රලේඛය. | • සමාගමේ වැඩබලන සභාපතිවරයා සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර් 2040 ක් පමණක් වුවත් ඉන්ධන ලීටර් 3,994 ක් සපයා තිබීම හේතුවෙන් අනුමත සීමාව ඉක්මවා ලීටර් 1,954 ක් සපයා තිබුණි.<br><br>• චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රවාහන හා ඉන්ධන දීමනා සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 338 දෙනෙකුට ප්‍රවාහන හා ඉන්ධන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.26,421,410 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 2017 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩී/03/2017 දරන චක්‍රලේඛය | (i) චක්‍රලේඛ විධිවිධාන මගින් "අදාළ මුදල් වර්ෂය තුළ අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති හා එම අලාභදායී බව පූර්ව මුදල් වර්ෂයට සාපේක්ෂව අඩු කර ගැනීමට අපොහොසත් වූ රාජ්‍ය සමාගම්වල සේවකයන් කෙරෙහි සානුකම්පිතව සලකා බලා එක් සේවකයෙකුට රු.3,000 ක් පමණක් ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැකිය" යනුවෙන් අවධාරනය කර තිබුණි. නමුත් එයට පටහැනි ලෙස භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාගම විසින් 2017 වර්ෂය තුළදී මාධ්‍ය ජාලයේ එක් සේවකයෙකුට රු.38,000 බැගින් එකතුව රු.25,878,379 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. එම ප්‍රසාද දීමනාවට අමතරව සේවකයන්ට දිරි දීමනා, කාර්ය සාධන දිරි දීමනා සහ කාර්ය මණ්ඩල සුබසාධන දීමනා වශයෙන් එකතුව රු.72,721,144 ක් ද ගෙවා තිබුණි.<br><br>(ii) චක්‍රලේඛයේ 3.3 ඡේදයේ උපදෙස් ප්‍රකාරව, ප්‍රසාද දීමනා ගෙවීමට නම් සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධිවිධානයන් ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිය යුතුය. එසේ වුවත් 2016 සහ 2017 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ පිළිවෙලින් 2017 අප්‍රේල් 08 සහ 2018 අප්‍රේල් 04 යන දිනයන්හිදීය. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන ඡේදය | රාජ්‍ය ආයතනවල ගර්භිත වාහන අපහරණයෙන් ලැබෙන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් සමාගම විසින් වාහන 04 ක් අපහරණයෙන් ලද රු.3,587,706 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. එසේම, චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති ආකෘති අංක 02 ට අනුව වාහන අපහරණ ක්‍රියාවලිය අවසාන වූ පසු ඊට අදාළව විස්තරාත්මක වාර්තාවක් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට, භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට, ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විගණකාධිපතිවරයාට පිටපත් සහිතව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට යැවිය යුතු වුවත් එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මුදල් රෙගුලාසි 380 (2) අනුව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා විසින් අනුමත කරන ලද බැංකුවක රජකාරි ගිණුමක් ආරම්භ කිරීමට ආයතන ප්‍රධානීන්ට බලය ඇත. ඒ අනුව සමාගමේ නාලිකා 04 සඳහා බැංකු ගිණුම් 22 ක් පවත්වාගෙන යන නමුත් එසේ බැංකු ගිණුම් 04 කට වැඩි සංඛ්‍යාවක් පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙතින් ලබාගත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ බදු පසු අලාභය රු.295,924,136 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු අලාභය රු.107,189,266 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.188,734,870 ක් හෙවත් සියයට 176 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම රු.371,639,775 කින් හෙවත් සියයට 21 කින් අඩු වී තිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

අයිටීඑන් නාලිකාවේ 2016 වර්ෂයේදී රු.8,618,025 ක අලාභයක් ලබා තිබුණු අතර 2017 වර්ෂයේදී එය රු.252,363,996 ක අලාභයක් දක්වා එනම් අලාභය රු.243,745,971 කින් හෙවත් සියයට 2,828 කින් වැඩි වී තිබුණි. වසන්තම් ටීවී, වසන්තම් එෆ්එම් සහ අයිටීඑන් එෆ්එම් නාලිකා තුනෙහි 2016 සහ 2017 වර්ෂ දෙකෙහිම අලාභයන් ලබා තිබුණු නමුත් එම අලාභයන් පිළිවෙලින් රු.19,230,801 කින්, රු.7,120,642 කින් සහ රු.26,083,691 කින් අඩු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ ලාභදායී අනුපාත පහත දැක්වේ.

| අනුපාතය | 2017 | 2016 |
|---|---|---|
| දළ ලාභ අනුපාතය (සියයට) | 65 | 77 |
| ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය (සියයට) | (4) | 18 |

ඉහත දැක්වෙන ආකාරයට අනුපාතයන්හි පිරිහීම අනාගතයේදී ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සහ ද්‍රවශීලතාවය කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇති බව නිරීක්ෂණය කෙරේ.

### 3.3 සමාගමට එරෙහිව හෝ සමාගම විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, සමාගමේ ප්‍රවෘත්ති විකාශය තුළදී සිදු වූ අපහාස කිරීම් වෙනුවෙන් බාහිර පාර්ශවයන් විසින් නඩු 04 ක් පවරා තිබුණු අතර ඒ සඳහා ඉල්ලුම් කර තිබුණු වන්දි මුදල රු.2,555,000,000 කි. සමාගම විසින් හිමිකරුවන්ගේ චිත්‍රපට අවසරයකින් තොරව විකාශය කිරීම හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් සමාගමට එරෙහිව නඩු 04 ක් පවරා තිබුණි. එසේම, වැඩ තහනම් කරන ලද සේවකයන් තිදෙනෙකු සහ අනිවාර්ය විශ්‍රාම ගන්වන ලද සේවකයන් දෙදෙනෙකු විසින් නඩු 05 ක් පවරා තිබුණි. මෙම නඩු සඳහා නීතිඥ ගාස්තු වශයෙන් රු.1,014,800 ක් ගෙවා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් ලබා දී තිබුණු ගුවන් කාලය වෙනුවෙන් අය විය යුතු රු.16,950,386 ක් අය කර ගැනීම සඳහා ණයගැතියන්ට එරෙහිව නඩු 10 ක් පවරා තිබුණු අතර එයින් රු.3,474,077 ක් අය විය යුතු ණයගැතියන් තිදෙනෙකුගේ ස්ථිර පදිංචි ස්ථානයන් සොයා ගත නොහැකි වීම නිසා සහ රු.2,702,500 ක් අය විය යුතු ණයගැතියෙකු අතුරුදහන් වීම නිසා එම නඩු ඉදිරියට පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට වසරකට වැඩි කාලයක් පවතින ණයගැති ශේෂය රු.178,239,352

ක් වුවත් මුදල් අය කර ගැනීම සඳහා නඩු පවරා තිබුණේ රු.16,950,380 ක් වෙනුවෙන් පමණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

#### 4.1.1 සැලසුම් කිරීම

---

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලයට සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් එය 2017 වර්ෂය සඳහා සමාලෝචනය හා යාවත්කාලීන කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමේදී ඒ තුළ ඇතුළත් විය යුතු ඉතා වැදගත් කරුණු කිහිපයක් පිළිබඳව අවධාරණය කර ඇත. නමුත් සමාගම විසින් 2014 සිට 2018 වර්ෂය දක්වා කාලයට පිළියෙල කරන ලද සැලැස්මේ සමාගමට තිබෙන සම්පත් පිළිබඳව තොරතුරු, සමාගමේ සංවිධාන සැලැස්ම, පූර්ව වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනය ආදිය ඇතුළත් කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් පුහුණු කිරීම් හා සංවර්ධනය කිරීමේ ආයතනයෙන් විශාල ප්‍රමාණයේ ඉදිකිරීම් සඳහා නිකුත්කර තිබුණු ICTAD/SBD/02 දරන සම්මත ලංසු ලියවිලිවල 14.8 වගන්තිය අනුව ඉදිකිරීම භාරදීමෙන් පසු රඳවාගත් මුදලින් සියයට 50 ක් නිදහස් කළ හැකි වුවත් ඊට පටහැනි ලෙස කොන්ත්‍රාත් ගිවිසුමේ 14.8 වගන්තිය මගින් රඳවා ගැනීමේ කාල සීමාව නිමවීමට පෙර කොන්ත්‍රාත්කරු විසින් කොන්දේසි විරහිත ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් රඳවා ගැනීමේ මුදල් නිදහස් කරන බවට එකඟ වී තිබුණි. ඒ අනුව සමාගමේ කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ලේ රු.6,681,418 ක් වූ රඳවා ගැනීමේ සම්පූර්ණ මුදල රඳවා ගැනීමේ කාල සීමාව නිම වීමට ප්‍රථම රඳවා ගැනීමේ මුදල් ඇපකරයක් මත නිදහස් කර තිබුණු නමුත් මෙම ඇපකරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 1983 මාර්තු 14 දින ඉංග්‍රීසි යතුරු ලේඛිකාවක් ලෙස සමාගමේ සේවයට බැඳුනු අයෙක් විසින් ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිසිවක් 2017 දෙසැම්බර් 31 දින වන තුරුම සිදු කර නොතිබුණි.

(ඇ) 2015 සහ 2016 වර්ෂයන්හිදී වාහන 09 ක් අනතුරුවලට ලක් වී ඇතත් රක්ෂණ වන්දි සඳහා හිමිකම් පෑමට ප්‍රමාද වීම නිසා ඒ සඳහා රු.521,300 ක් වූ රක්ෂණ වන්දි 2017 දෙසැම්බර් 31 දින වන තුරුම ලබාගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 පෙබරවාරි 04 දින නිව්යෝර්ක්හිදී පවත්වන ලද නිදහස් සැමරුම් උළෙල සඳහා සමාගමේ ප්‍රවෘත්ති අංශයේ නිලධාරීන් තිදෙනෙකු සහභාගී වී තිබුණි. ඔවුන්ගේ ගුවන් ප්‍රවේශ පත්‍ර ගාස්තු වෙනුවෙන් සමාගම විසින් රු.243,000 ක් වැය කර තිබුණු අතර එම මුදල මාධ්‍ය ආවරණය ඇසුරින් සකස් කරන ලද වැඩසටහනක් විකාශය කිරීම සඳහා ලබාගන්නා අනුග්‍රාහක දායකත්වයක් මගින් පියවීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රවෘත්ති) විසින් දැනුම් දී තිබුණි. නමුත් එම මුදල 2017 වර්ෂය අවසාන වන විටද, ලැබී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී දේශීය ටෙලි නාට්‍ය 10 කින් රු.315,336,014 ක ලාභයක් ලබා තිබුණු අතර නාට්‍ය 20 කින් රු.100,363,367 ක අලාභයක් ලබා තිබුණි. මෙම ලාභයෙන් රු.214,972,647 ක් හෙවත් සියයට 84 ක් ලබා ගෙන තිබුණේ සමාගම විසින් නිෂ්පාදිත නාට්‍ය දෙකකිනි. නාට්‍ය සමීක්ෂණ මණ්ඩලයේ සමහර සාමාජිකයන් විසින් එම නාට්‍ය ප්‍රදර්ශනය සඳහා නුසුදුසු බව දන්වා තිබියදීත් විකාශය සඳහා තෝරා ගැනීම, නාට්‍ය සමීක්ෂණ මණ්ඩලය විසින් එම නාට්‍ය පූර්ව දර්ශනය කර නොතිබීම, සමීක්ෂණ මණ්ඩලය මගින් අනුමත කර තිබුණද නාට්‍ය ප්‍රදර්ශනයේදී ආදායම අඩු වීම, එක් සමීක්ෂණ මණ්ඩලයක් මගින් නාට්‍ය නුසුදුසු බව තීරණය කර තිබියදී වෙනත් සමීක්ෂණ මණ්ඩලයකට යොමු කර සුදුසු බවට නිර්දේශ ලබා ගැනීම, සමාගමේ නිෂ්පාදකවරුන් විසින් පමණක් නාට්‍ය ප්‍රදර්ශනය සුදුසු බව නිර්දේශ කිරීම, කථාංග 75 කට වැඩි සංඛ්‍යාවක් ඇතුළත් නාට්‍යකින් කථාංග 15 ක් පමණක් සමීක්ෂණ මණ්ඩලය විසින් නැරඹීම වැනි කරුණු නාට්‍ය මගින් අලාභ ලැබීම සඳහා හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 මාර්තු මාසයේ සිට විකාශය වීම ආරම්භ කරන ලද ජපානයෙන් ප්‍රදානයක් වශයෙන් ලද නාට්‍යයක හඬ කැවීම් ඇතුළු අනෙකුත් වියදම් සඳහා රු.2,160,600 ක් දැරීමෙන් පසුව විකාශනය මගින් ආදායම වශයෙන් ලැබී තිබුණේ රු.659,998 ක් පමණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දින වන විට එම නාට්‍ය විකාශය මඟින් රු.1,500,602 ක අලාභයක් ලබා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් සමාගමේ පුනරාවර්තන වියදම් සඳහා පොලියද සමග වටිනාකම රු.284,938,932 ක් වූ කෙටිකාලීන ස්ථාවර තැන්පතු මුදල් බවට පත්කරගෙන තිබුණු අතර නව ආයෝජන කිසිවක් ඇති කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙනියාය ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති විදුලි බලාගාරය සඳහා 2015 වර්ෂයේදී මිල දී ගන්නා ලද රු.1,588,500 ක් වටිනා Power Distribution Rack, සැලසුම් වෙනස් වීම මත අවශ්‍ය නොවූ බව දන්වමින් 2017 දෙසැම්බර් 31 දින වන තුරුම භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) සමාගමේ අභ්‍යන්තර විගණන අංශය මගින් කරන ලද විගණන පරීක්ෂණයකට අනුව සමාගමේ ප්‍රධාන ගබඩාව තුළ තිබෙන ඉලෙක්ට්‍රොනික සහ අමතර කොටස් වර්ගවලට අයත් භාවිතයට නොගැනෙන සහ සෙමින් චලනය වන තොගවල වටිනාකම රු.8,828,892 ක් විය. නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සෙමින් චලනය වන තොග වශයෙන් රු.7,130,390 ක් පමණක් හඳුනා ගෙන එම තොග ලියා හැරීම සඳහා ප්‍රතිපාදන සලස්වා තිබුණි. ඒ අනුව රු.1,698,502 ක් වටිනා භාවිතයට නොගැනෙන සහ සෙමින් චලනය වන තොග, තොග ශේෂය තුළ පවතින බව නිරීක්ෂණය විය.

**4.5** **හඳුනා ගන්නා ලද පාඩු**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.1,037,763 ක් වටිනා ඉංග්‍රීසි චිත්‍රපටි 12 ක් සහ 2015 වර්ෂයේදී සමාගම විසින් නිෂ්පාදනය කරන ලද රු.1,184,575 ක් වටිනා නාට්‍යයකට අදාළ එකතු වටිනාකම රු.2,222,338 ක් අස්පෘෂ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ඉදිරියට කරන ලද ගෙවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, මෙම ඉංග්‍රීසි චිත්‍රපට අතුරින් චිත්‍රපටි 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එක වාරයක් බැගින් විකාශය කර තිබුණු අතර ගිවිසුම අනුව 2017 දෙසැම්බර් 31 දින වන විට එම සියලුම චිත්‍රපට විකාශය කිරීමේ කාල සීමාව ඉකුත් වී තිබුණි. ඒ අනුව මෙම කාලය ඉකුත් වූ රු.1,037,763 ක් වන ඉංග්‍රීසි චිත්‍රපටවල වටිනාකම ක්‍රමක්ෂය කර අවසාන වී තිබිය යුතු වුවත් මුළු මුදලම තවදුරටත් ඉදිරි ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාගමේ හිටපු ගණකාධිකාරී විසින් 2011 වර්ෂයේදී වංචා කරන ලද මුදලකින් තවදුරටත් ලැබිය යුතු වටිනාකම රු.1,210,620 ක් වූ අතර මේ සම්බන්ධයෙන් ගන්නා ලද අධිකරණමය ක්‍රියා මාර්ගයේදී ඒ සඳහා රීට් ආඥාවක් නිකුත් කරන ලද නමුත් එය භාර දීම සඳහා ඔහුගේ ලිපිනය සොයා ගැනීමට නොහැකි වී තිබුණි. එම සම්පූර්ණ වටිනාකම සඳහා හානිකරන ගැලපීම් සිදුකර තිබුණි.

**4.6** **කාර්ය මණ්ඩල පරිපාලනය**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ප්‍රධාන අලෙවි නිලධාරි තනතුර සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2017 ජූලි 06 දිනැති ලිපිය මගින් 2016 අප්‍රේල් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 ට අනුකූල වැටුප් කේත MM 1-1 අදාල වන පරිදි 2017 ජූලි 06 දින සිට ප්‍රධාන අලෙවි නිලධාරි තනතුර අනුමත කර තිබුණද කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියෙන් තොරව 2017 ජනවාරි 01 දින සිට ජූලි 06 දක්වා කාලයට එම තනතුර සඳහා නිලධාරිනියෙක් බඳවාගෙන තිබුණි. නමුත් 2017 දෙසැම්බර් 31 දින දක්වාම එම තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි.

(ii) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමයන්ට අනුකූල නොවන ලෙස මෙම තනතුර සඳහා බඳවා ගන්නා ලද නිලධාරිනියට 2017 ජනවාරි 02 දින සිට සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම මූලික වැටුප රු.150,000 ක්, විශේෂ දීමනාව රු.50,000 ක්, සංග්‍රහ දීමනාව රු.50,000 ක්, ප්‍රවාහන දීමනාව රු.100,000 ක් සහ දුරකථන දීමනාව රු.4,000 ක් වශයෙන් මාසිකව රු.354,000 ක් බැගින් දීමනාවක් ගෙවා තිබුණි. එසේ වුවද මෙම තනතුර අනුමත වීමෙන් පසුව 2017 ජූලි මාසයේ සිට බඳවා ගත යුතු නිලධාරිනියට මාසිකව ගෙවිය යුතු වැටුප රු.48,568 ක් පමණක් විය යුතු වුවත් මාසිකව රු.354,000 ක් ගෙවීම හේතුවෙන් එම නිලධාරිනියට මාසිකව රු.305,432 බැගින් වැඩියෙන් ගෙවා තිබුණි.

(iii) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව රාජකාරි හා පුද්ගලික පාවිච්චිය සඳහා නිල වාහනයක් හෝ මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැක්කේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින්

2006 වර්ෂයේ නිකුත් කරන ලද අංක MSD 30 චක්‍රලේඛය ප්‍රකාරව HM 1-1 ගණයේ හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දරන නිලධාරියෙකුට පමණි. එසේ වුවත් MM 1-1 වැටුප් කේතය අදාළ විය යුතු මෙම නිලධාරිනියට මාසිකව රු.100,000 බැගින් ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) 2005 ජුනි 16 දිනැති අංක අමප/05/විවිධ (026) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව උපදේශකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී නම් කරනු ලබන්නාගේ ජීව දත්ත තොරතුරු, ඔහුට පැවරීමට නියමිත කාර්යභාරය, සහ කාල වකවානුව සමග සංදේශයක් ඉදිරිපත් කොට අමාත්‍ය අනුකාරක සභාවේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව බඳවා ගන්නා ලද උපදේශකවරුන් 05 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී සමාගමේ සිටි අතර 2017 වර්ෂය තුළදී, ඔවුනට මාසික දීමනා වශයෙන් එකතුව රු.4,518,333 ක්ද, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා වශයෙන් එකතුව රු.1,823,085 ක්ද ගෙවා තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ දී එක් උපදේශකවරයෙකු ඉවත් වී යන අවස්ථාවේ ඔහුට ආයතනයෙන් ලබා දෙන ලද ඇපල් වර්ගයේ දුරකථනය හා රූපවාහිනී යන්ත්‍රය ආපසු ලබා ගෙන නොතිබුණි. තවද, එම නිලධාරියාගේ පෞද්ගලික දුරකථන බිල්පත් පියවීම සඳහා අදාල සීමාව ඉක්මවා ගෙවන ලද රු.77,669 ක්ද නිලධාරියාගෙන් හෝ ගෙවීමට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගෙන නොතිබුණි.

(ඈ) සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ප්‍රධාන විධායක නිලධාරි නමින් තනතුරක් නොතිබියදී 2016 ජූලි මාසයේ සිට 2017 වර්ෂය අවසාන වන තුරුම ප්‍රධාන විධායක තනතුරක් සඳහා නිලධාරියෙකු බඳවා ගෙන ඔහුට මාසික දීමනා රු.90,000 ක්, වෙනත් දීමනා රු.30,000 ක්, ජීවන වියදම් දීමනා රු.7,800 ක් සහ සංග්‍රහ දීමනා රු.15,000 ක් වශයෙන් 2017 වර්ෂය තුළදී එකතුව රු.2,210,400 ක් ගෙවා තිබුණි. තවද, එම නිලධාරියාට 2017 වර්ෂය තුළදී සමාගමේ ජීප් රථයක් ලබා දී තිබුණු අතර එම වාහනයට ඉන්ධන ලීටර් 405 ක් බැගින් මාසිකව ලබා දී තිබුණි.

(ඉ) සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති තනතුරක් වූ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සමාගමේ ව්‍යවස්ථාවලියට අනුකූල නොවන පරිදි 2017 ජූනි 21 දින සිට නිලධාරියෙකු පත් කර තිබුණි. එදින සිට එම නිලධාරියාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද පත් කර තිබුණි. පහත සඳහන් කරුණුද නිරීක්ෂණය විය.

(i) 2015 මැයි 25 දිනැති අංක පීඩ්ඩී 1/2015, 2015 මැයි 25 දිනැති අංක පීඩ්ඩී 2/2015 සහ 2015 ජූනි 17 දිනැති අංක පීඩ්ඩී 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයක් තුළ විධිමත් පත්වීමක් ලැබූ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකුට මාසික දීමනාව රු.75,000 (පීඩ්ඩී 03/2015) ක්, ප්‍රවාහන පහසුකම් ලෙස රියදුරු සහිත නිල වාහනයක් හා ඉන්ධන ලීටර් 150 ක් හෝ නිල වාහනය වෙනුවට රු.50,000 ක දීමනාව හා සන්නිවේදන පහසුකම් සඳහා මාසික උපරිම සීමාව රු.5,000 ක් වශයෙන් ගෙවිය හැකිය. ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට 2017 ජූනි 28 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වන කාල සීමාව සඳහා මාසික වැටුප රු.75,000 ක්, සන්නිවේදන දීමනාව රු.5,000 ක් සහ සංග්‍රහ දීමනාව රු.15,000 ක් වශයෙන් එකතුව රු.457,500 ක් ගෙවා තිබුණි. තවද ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට සංග්‍රහ දීමනාවක් ගෙවීම සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමැතියක් නොමැති බවත් නිරීක්ෂණය විය. 2017 ජූලි සිට නොවැම්බර් 30 දින දක්වා ඉන්ධන ලීටර් 1,109 ක් භාවිතා කර තිබුණි.

(ii) ක්‍රියාකාරී අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වශයෙන් පත්වීම් භාරගත් දිනම එම නිලධාරියා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩසටහන්) තනතුරෙහි රාජකාරි ආවරණය සඳහා පත්කර තිබුණි. වැඩ බැලීමේ පත්වීමක් ලබා දිය යුත්තේ නිලධාරියෙකුගේ නිත්‍ය තනතුරට සමාන හෝ ඉහළ තනතුරක් සඳහා පමණක් වුවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරන ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩසටහන්) තනතුරෙහි රාජකාරි ආවරණය සඳහා පත් කර ඒ සඳහා දීමනාවන්ද ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එය ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 04 දිනදීය.

### 5.2 වෙළඳපොළ කොටස

ප්‍රේක්ෂකයින් රූපවාහිනිය නැරඹීම සහ ගුවන් විදුලියට සවන් දීම පිළිබඳව “සීමාසහිත ලංකා වෙළඳපොළ පර්යේෂණ කාර්යාංශය”(Lanka Market Research Bureau – LMRB) විසින් රූපවාහිනී නාලිකා 15 ක් සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණයට අනුව 2017 ජනවාරි මාසයේදී සියයට 7.5 ක්ව පැවති සමාගමේ වෙළඳපොළ කොටස දෙසැම්බර් මාසය වන විට සියයට 5.9 දක්වා අඩු වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයා වෙත වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | (i) | අගරු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | | (ii) | සේවාදායක ණය අයකර ගැනීම ප්‍රමාද වීම. |
| | | (iii) | ණය කාල සීමාව ඉක්මවා සේවාදායක ණය ලබා දීම. |
| | | (iv) | ප්‍රතිවෙළඳ ගනුදෙනු සඳහා එකඟ වූ සේවාවන් ලබා නොගැනීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | (i) | චක්‍රලේඛ නියමයන්ට පටහැනි ලෙස දීමනා ගෙවීම. |
| | | (ii) | වෙළඳපල කොටස රැක ගැනීම සහ වර්ධනය කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය. | | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි ලෙස අනුමත නොවූ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා පත් කිරීම සහ දීමනා ගෙවීම. |